**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2015**

**------------------------------------------------------------------------**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම,අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ හා ආදායම් වියදම් ගිණුමේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**2.1 මතය ව්‍යාචනය**

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------------**

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දහම් පාසල් කොඩි අලෙවි වාර්තාව අනුව මුළු වටිනාකම රු.12,492,750 ක් වූ කොඩි 499,710 ක් දිස්ත්‍රික්ක 21 ක ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 319 ක් අතර බෙදාහැර තිබුණද මුද්‍රිත කොඩි ප්‍රමාණය, අලෙවි නොවී ඉතිරි වූ කොඩි ප්‍රමාණය හා එම ඉතිරි ප්‍රමාණය ඇති ස්ථානය හෝ තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් මුළු ආදායමෙන් සියයට 92 ක් වූ රු.11,981,679 ක කොඩි අලෙවි ආදායම විගණනයේදී

සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ ඉතිරි තොග සත්‍යාපනය කිරීමට නොහැකි වීමෙන් ආදායමේ නිවැරදිතාවය හා සම්පූර්ණත්වය පිළිබඳ තහවුරු කරගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් ගෙවා තිබූ එකතුව රු.495,000 ක වෛද්‍යාධාර අදාළ ප්‍රතිලාභීන් වෙතම ලද බවට සනාථන ලබාගෙන නොතිබුණි.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ඉතිරි කිරීමේ ගිණුමෙන් ජංගම ගිණුමට රු.11,143,068 ක මුදලක් මාරු කර තිබුණි. එහෙත් ලෙජර ගිණුම් සමඟ ඉදිරිපත් කර තිබූ ලැබීම් හා ගෙවීම් ගිණුම අනුව ඉතිරි කිරීමේ ගිණුමෙන් ජංගම ගිණුමට මාරු කිරීම් ලෙස දක්වා තිබූ ප්‍රමාණය රු.10,685,171 ක් වූයෙන් රු.457,897 ක වෙනසක් පැවතුණි.

(ආ) මුදල් පොතට ආදේශකයක් ලෙස ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව වාර්ෂික කොඩි අලෙවි ආදායම රු.12,381,181 ක් විය. එහෙත් ආදායම් වියදම් ගිණුමේ එම ආදායම රු.11,981,679 ක් වූයෙන් රු.399,502 ක වෙනසක් පැවතුනි.

(ඇ) අරමුදලේ ජංගම ගිණුමට අනුව 2015 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙනා ශේෂය ද ඇතුළුව මුළු ලැබීම් රු.10,878,273 ක් වූ අතර වර්ෂය තුළ චෙක්පත් මඟින් සිදුකළ ගෙවීම් රු.11,068,488 ක් විය. මේ අනුව රු.190,215 ක අයිරාවක් තිබිය යුතු වුවත් ශේෂ පත්‍රයේ බැංකු ශේෂය රු.203,785 ක අතිරික්තයක් දක්වා තිබුණි. අරමුදල විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ සකස්කර නොතිබීම හේතුවෙන් රු.394,000 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර ගැනීමට නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් අරමුදල විසින් බැංකු ජංගම ගිණුමට අදාළව 2014 අප්‍රේල් සිට බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නොතිබුණි. |
| (ආ) 2005 දෙසැම්බර් 19 දිනැති අංක පීඊඩී 33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ආයෝජන රාජ්‍ය බැංකුවල පමණක් සිදුකළ යුතු වුවත්, අරමුදල විසින් රු.5,495,000 ක් පෞද්ගලික බැංකුවක ස්ථිර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ අතිරික්තය රු.1,541,721 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,158,685 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.383,036 ක හෙවත් සියයට 33 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර වියදම රු.4,033,000 කින් වැඩි වුව ද කොඩි අලෙවි ආදායම රු.5,885,699 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

දහම් පාසල් සේවයේ වසර 50 ක සේවාකාලයක් සම්පූර්ණ කළ ගුරුභවතුන් සඳහා මසකට ගෙවන රු. 1,000 දීමනාව 2015 වර්ෂයට අදාළව ගෙවීම් ආරම්භ කර තිබුණේ 2016 අගෝස්තු මාසයේදීය. මේ අනුව වර්ෂයට අදාළ ගෙවීම් එම වර්ෂය තුළදීම ගෙවීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

මූල්‍ය ප්‍රකාශනවල වූ රු.11,981,679 ක කොඩි අලෙවි ආදායම වශයෙන් බැංකු ඉතිරි කිරීමේ ගිණුමට 2015 වර්ෂයේ ජනවාරි 02 දින සිට දෙසැම්බර් 31 දක්වා බැරකරන ලද මුදල් ප්‍රමාණය ගෙන තිබුණි. එහෙත් 2015 වර්ෂයේ කොඩි මුද්‍රණය කර තිබුණේ 2015 සැප්තැම්බර් මාසයේ වූ බැවින් 2015 සැප්තැම්බර් මාසයට පෙර තැන්පත් කරන ලද මුදල් 2014 වර්ෂයේ කොඩි අලෙවි කිරීමෙන් ලද ආදායම බව නිරීක්ෂණය වේ. මේ අනුව අරමුදල සතුව වාර්ෂික කොඩි අලෙවි ආදායම නිශ්චිතව ගණනය කර ගත හැකි ක්‍රමවේදයක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම එකතුවන මුදල් අවභාවිතයට ඉඩ පවතින බව හා නිවැරදිව ගිණුම් ගත නොවීමේ අවදානමක් ද පවතින බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඊඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2017 ජනවාරි 04 දිනදීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 3 ඡේදයේ සඳහන් අරමුණු ළඟාකරගත හැකි වන ආකාරයට වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එසේ සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදි.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | අරමුදල විසින් මුද්‍රණය කර විකුණනු ලබන කොඩිවල ආදායම හා වියදම පැහැදිලිව හඳුනාගතහැකි පරිදි ලෙජර් ගිණුම් පවත්වා නොතිබීම. |
| | | (ii) | ලෙජර් ගිණුම් පැහැදිලිව, නිවැරදිව හා විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| | | (iii) | ජංගම ගිණුමෙන් කරන ලද වියදම් සඳහා මුදල් පොතක් හා විධිමත්ව වවුචර් පිළියෙල කර නොතිබීම. |
| | | (iv) | ලද ආදායම් සඳහා ලදුපත් නිකුත් කර නොතිබීම. |
| (ආ) | කොඩි මුද්‍රණය හා විකිණීම | | මුද්‍රණය කරන ලද කොඩි සඳහා අනු අංක යොදා නොතිබීම හා නොවිකිණී ඉතිරි වූ කොඩි ආපසු භාර ගැනීම, වාර්තා කිරීම, ලද හා ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් නොතිබීම. |